## 229 අමා රජිඳුනේ

අමා රජිඳුනේ ඔබයි දෙවිඳු ප්‍රේමයේ
සැම වෙනුවෙන් දිවි දෙමින් මරණෙ ජය ගතී

සොවුරු පිණිස දිවිය පුදන ප්‍රේමයයි අගේ
කිතු සමිඳුන් අප වෙනුවෙන් පිදෙයි දෙවිඳුනේ

නොබෙදි පිදෙන ආදරයකි සැමට නොඅඩු සේ
සලකුණ වෙයි හිතැති අදනගෙ ලොවක ඉදිරියේ

සමගි සිතින් එක්සත් වී ජය ගොස නගමු
මැරවරකම් හොර වංචා පිළිකුල් කරමු

සදා සැපත ලබන ලෙසින් කිතු සමිඳුන්ගේ
අවංකවම සැම කටයුතු සපුරා කරමු